


# ධන පරිහරණයට අදාළ බොදු මග


මේ ගසේ බොහෝ පැණි දොඩම් තිබේ
පැහිල ඉදිල බිමට නැමිල බරවෙලා අතු
නංගිටයි මටයි ගෙඩි දෙකක් ඇති
වැඩිය කඩන නරක ළමයි හෙම නොවේ අපි

මේ කුඩා කවිය අප කොතෙකුත් අසා ඇත. මෙම කවියෙන් ලබා දෙන අරුත ඉතා ම පරිපූර්ණ ය. දොඩම් ගසේ අතු බරවෙන තරමට ම පැසුණු දොඩම් බොහෝ ඇත. නමුත් මෙම දරුවා ගසෙන් ඉල්ලන්නේ නංගීටත් තමාටත් ගෙඩි දෙකක් පමණි. සම්පත් පරිහරණය, අරපිරිමැස්ම, සම්පත් සුරක්ෂිතතාව හා කළමනාකාරිත්වය ගැන කදිම උපදේශයක් මෙයින් ලබා ගත හැකි ය. සම්පත් පරිහරණය හා තඩත්තුව ගැන විශේෂ සැලකිල්ලක් දැක්වූ මෙරට ගැමි බෞද්ධයෝ සිදුරු වූ කළය, කුල්ල පවා පිළියම් කොට භාවිතයට ගත්තෝ ය. භව භෝග සම්පත් අරපිරිමැස්මෙන් භාවිතයට ගත්හ; සෑම ආහාර වේලක දී ම සහල් මිටක් වෙන්කර එය අසරණ අයෙකුට පිනට දුන්හ. ගස් යට වැටුණු කොස් ඇටය පවා එකතු කර විවිධ ක්‍රම භාවිත කොට කල් තබා ගත්තේ පසු ව පරිහරණයට ගැනීමේ අපේක්ෂාවෙනි. මේ ආකාරයට සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා භික්ෂු සමාජයේ ආදර්ශය ඔවුන් ව පොළඹවා තිබේ. ආනන්ද හිමියන් සහ උදේනි රජතුමා අතර චීවර පරිහරණය හා සම්බන්ධ ව ඉදිරිපත් වූ කතා පුවත එයට එක් නිදසුනක් වෙයි.

වරක් ආනන්ද තෙරණුවෝ භික්ෂූන් වහන්සේ පන්සීයක් සමග ඡන්න තෙරුන් මුණ ගැසීමට වැඩම කොට උදේනි රජතුමාගේ උද්‍යානයේ වැඩ සිටියහ.

මේ ගැන දැන ගත් උදේනි රජුගේ බිසෝවරු රජුගෙන් අවසර ලබාගෙන එහි ගොස් බණ අසා පැහැදී එකිනෙකා සළුව බැගින් උන් වහන්සේට පූජා කළහ. දහම් අසා ආපසු එන බිසෝවරුන්ගෙන් තොරතුරු විමසූ රජතුමා ධර්මය දේශනා කළ ආනන්ද හිමියනට දහම් පඬුරු වශයෙන් කුමක් පූජා කළේ දැ යි ඇසී ය.

එවිට ඔවුන් කියා සිටියේ එක් සළුව බැගින් සළු පන්සියයක් පූජා කළ බවයි. ආනන්ද හිමියන්ට සළු පන්සීයක් කුමකට දැ යි ප්‍රශ්න කළ රජු එම සළුවලින් කුමන ප්‍රයෝජන ගන්නේ දැ යි උන් වහන්සේ වෙත ගොස් විමසා සිටියේ ය. එහි දී රජු ඇමතූ අනඳ තෙරණුවෝ මෙසේ පැවසූහ. "දිරා ගිය සිවුරු ඇති භික්ෂූන් වහන්සේලාට සිවුරු සකසා ගැනීමට මේ සළු බෙදා දෙනු ලැබේ. එම භික්ෂූහු තමන් පරිහරණය කළ සිවුරු එයට වඩා දිරා ගිය සිවුරු ඇති භික්ෂූන් වහන්සේලාට පිරිනමති. තව දුරටත් සිවුරු වශයෙන් පරිහරණය කිරීමට අපහසු ඒවායින් ඇතිරිලි තනා ගනිති. ඇතිරිලිවලට ගත නොහැකි සිවුරු කොට්ට උර තනා ගැන්මට යොදා ගනිති. එසේත් ප්‍රයෝජනයට ගත නොහැකි සිවුරු බිම පාපිස්නා සඳහා යොදා ගනිති. පාපිසි සඳහා යොදා ගත නොහැකි සිවුරු කැබලි තෙමා බිම පිරිසිදු කිරීමට යොදා ගන්නා අතර එබඳු ප්‍රයෝජනයකටවත් ගත නොහැකි සිවුරු කැබලි මැටි සමග කළවම් කොට බිත්ති සකස් කර ගැනීමට යොදා ගනිති."



ආනන්ද හිමියන් ලබා දුන් මෙම පිළිතුරෙන් භික්ෂූන් වහන්සේලා සම්පත් පරිහරණය කිරීමේ දී දක්වන අරපිරිමැස්ම ගැන පැහැදුණු උදේනි රජතුමා තවත් සළු පන්සියක් පූජා කළ බව සඳහන් වේ.

මෙම කතා පුවත අද දවසේ ජීවත් වන අපට බොහෝ ආදර්ශ ලබා දේ. අද බොහෝ දෙනා තමා අඳින ඇඳුමෙහි සුළු හෝ පළුදු වීමක් සිදුවුවහොත් එය මසා නැවත ඇඳීමට යොමු නොවෙති; තව කලක් ඇඳීමට හැකි එම ඇඳුම භාවිතයෙන් ඉවත් කරති. එය සම්පත් අපතේ හැරීමකි. සම්පත්වලින් උපරිම ප්‍රයෝජන නොගෙන අපතේ හැරීම අනාගත පරපුරට හිමි සම්පත් අහිමි කිරීමකි. ඇතැම් අය තම පෞද්ගලික දේපළ මෙන් ම පොදු දේපළ පරිහරණය පිළිබඳ දක්වන සැලකිල්ල ද කනගාටුදායක වේ. අපට නොමිලේ ලැබෙන පොත තවත් සහෝදර ශිෂ්‍යයන්ට වසර කිහිපයක් භාවිත කළ හැකි පරිදි නඩත්තු කරනවා ද යන්න සිතා බැලිය යුත්තකි. පිට කවරය ගැලවුණු විගස එය භාවිතයෙන් ඉවත් කිරීම, කොළ කැඩීම, කුරුටු ගෑම වැනි ක්‍රියා නිසා විශාල සම්පතක් විනාශ වේ. මේ ආකාරයට ම ඇතැම් විට පාසලේ ලී බඩු උපකරණ තරමක් අබලන් වූ විට නැවත පිළිසකර කොට භාවිතයට නොගෙන විනාශ වී යාමට ඉඩ හැර ඇත. පන්තියේ කළුලෑල්ලේ ලිවීමට භාවිත කරන හුණු කෑල්ල අවසන් වනතුරු භාවිතයට ගන්නා අවස්ථා දක ගැනීම ඉතාමත් විරල ය. ඒවා කාණුවල, මිදුල්වල විනාශ වී යෑමට ඉඩ හැර ඇත. මේ ආකාරයට සම්පත්වලින් උපරිම ප්‍රතිඵල ලබා නොගෙන විනාශ වීමට ඉඩ හැරීම අපරාධයකි. මේවායෙහි අනිටු විපාකවලට ඉතා ම කෙටි කාලසීමාවක් තුළ දී අපට මුහුණ දීමට සිදුවේ. එයට හේතුව මේ මිහිතලය මත ඇත්තේ සීමාසහිත සම්පත් ප්‍රමාණයක් වීමයි. වැඩි වන ජනගහනයට හා ඔවුනගේ අවශ්‍යතාවලට අනුරූපී ව ඇතැම් සම්පත්වල වැඩි වීමක් සිදු නොවේ. ඒ නිසා සම්පත් අරපරිස්සමින් භාවිතයට ගැනීමට අප හුරු පුරුදු විය යුතු ය.

ඇතැම් අය සියල්ල තමන් සතු කර ගැනීමට උත්සාහ ගන්නා බවක් ද දක්නට ලැබේ. එය ආත්මාර්ථකාමී සිතුවිල්ලකි. මහිච්ඡතාවේ ලක්ෂණයකි. බුදුරදුන් ජීවමාන කාලයේ ද අසීමිත ලෙස සම්පත්වලට ඇලුම් කොට ඒවා ගොඩ ගසා ගැනීමේ කැමැත්තෙන් ක්‍රියා කළ බහු භාණ්ඩික භික්ෂූන් වහන්සේ නමක් පිළිබඳ කතා පුවතක් බණ පොතේ දක්වේ. උපනන්ද හිමියන් තමනට අවශ්‍ය තරමට වඩා විශාල ලෙස සම්පත් රැස්කර තබාගෙන සිටින බව බුදුරජාණන් වහන්සේට දැන ගැනීමට ලැබීමෙන් අනතුරුව එම සම්පත් පොදු පරිහරණයට යොමු කිරීමට උන් වහන්සේ උපදෙස් දුන්හ. භික්ෂු සමාජය තුළ පෞද්ගලික දේපළ අයිතියක් නැත. ඇත්තේ පොදු දේපළ අයිතියකි.

සාංඝික ක්‍රමය ලෙස ශාසන ව්‍යවහාරයේ පවතින්නේ එම ක්‍රමයයි. සම්පත් බෙදා හදාගෙන පරිහරණය කිරීමෙන් සමාජය තුළ සහජීවනය ද දියුණු වෙයි. සාමූහික ව සමගියෙන් ජීවත් වීමට මේ තුළින් අවකාශය ලැබී ඇත.

ධන පරිහරණයේ දී සමජීවිකතාව බෙහෙවින් වැදගත් කරුණකි. එයින් අදහස් කරන්නේ පුද්ගලයෙකුගේ ආදායමට සරිලන ආකාරයට වියදම් කළ යුතු බවයි. අය - වැය ගැන නොසලකා කටයුතු කළහොත් සම්පත්වලින් නිසි ඵල ලබා ගැනීමට නොහැකි වේ. ඇතැමෙක් උපයන සියල්ල පරිභෝජනය කරති. අනාගතයට ඉතිරි කිරීමක් නොමැත. හදිසි කරදරයක්, විපතක් සිදුවුවහොත් ඉතුරු කර ගත් දෙයක් නොමැති නිසා ඔවුහු දුකට පත්වෙති. උපයන සියල්ල වැය කරන්නන් බුදු දහමේ හඳුන්වා දී ඇත්තේ **උදුම්බරඛාදිකයින්** ලෙසයි. උදුම්බර යනු අට්ටික්කා ය . ඇතැමෙක් ගහේ අතු සොලවා අට්ටික්කා ලබා ගැනීමට උත්සාහ ගනිති. එවිට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා ගෙඩි වැටේ. බොහොමයක් ගෙඩි අපතේ යයි. එය අපරාධයකි; අරපිරිමැස්මට ප්‍රතිවිරුද්ධ ය.

ඇතැම් අය නොකා නොබී ධනය උපයති. ඔවුනගේ මූලික අපේක්ෂාව ධනය ඉපැයීම පමණි. අත්‍යවශ්‍ය දෙයකටවත් ධනය වැය නොකරති. එවැනි පුද්ගලයන්ගෙන් සමාජයට ද කිසිදු සේවාවක් සිදු නොවේ. ඔවුහු අදින්න පුබ්බක වැනි මසුරු සිටුවරුන් ලෙස ක්‍රියා කරති; නොකා නොබී ධනය උපයා තබා මිය යති. එබඳු පුද්ගලයින් **අජද්ධුමාරිකයින්** ලෙස බුදු දහමේ හඳුන්වා ඇත. අජද්ධුමාරිකයා යනු අකාලයේ මිය යන්නා ය.

ඇතැම් අය තමාගේ අය සහ වැය හරියාකාර ව දැන කටයුතු කරති. තරාදියකින් බඩු කිරන්නෙකු තුලාව සමබර ව පවත්වාගෙන යන්නාක් මෙන් තමාගේ අය වැය සමබර ව පවත්වාගෙන යති. තම ආර්ථිකය නිවැරැදි ව කළමනාකරණය කර ගැනීමට ඒ මගින් හැකියාව ලැබේ. ඔවුහු **තුලාධාරික** පුද්ගලයින් ලෙස හැඳින්වෙති. සමජීවිකතාවෙන් යුතු ව ක්‍රියා කරන්නේ මෙම තුලාධාරික පුද්ගලයන්ගෙනි.

ධන පරිහරණයට අදාළ තවත් ඉගැන්වීමක් සිගාලෝවාද සූත්‍රයේ දැක්වේ. එමගින් ධනය කොටස් හතරකට බෙදා පරිහරණය කිරීමට උපදෙස් ලබා දෙයි. ඒ අනුව,

¼ පරිභෝජනයට

²⁄₄ ආයෝජනයට (තමන් කරන කර්මාන්තවල දියුණුවට යෙදවීම)

¼ ඉතිරි කිරීමට (තමන්ට විපතක් කරදරයක් ඇතිවූ විට ලබා ගැනීමට)

මේ ආකාරයට ලොකු කඩා සෑම අයෙකු ම පවත්නා වූ සීමිත සම්පත් අරපරිස්සමෙන් සැලසුම් සහගත ව පරිහරණය කිරීමට යොමු විය යුතු ය. එවිට පුද්ගලයාගේ ආර්ථික සංවර්ධනයත් සමාජයේ සංවර්ධනයත් සිදුවන්නේ ය.



## සාරාංශය

භෞතික ලෝකයේ පවත්නා සීමිත සම්පත් නිසි කළමනාකරණයකින් යුතු ව පරිහරණයට යොමුවීම මගින් අනාගතයේ සම්පත් හිගවීම නිසා ඇති වන අනේක විධ ගැටලුවලට විසඳුම් බෞද්ධ ඉගැන්වීම් තුළින් සපයා ගත හැකි ය. පෞද්ගලික ව පරිහරණය කරන දේ මෙන් ම පාසලේ දී සමාජයේ දී අප පරිහරණය කරන දේත් අරපරිස්සමින් යුතු ව පරිහරණයට යොමු විය යුතු ය.



## ක්‍රියාකාරකම

1. සම්පත් අරපිරිමැස්මෙන් තොර ව භාවිතයට ගැනීමෙන් ලැබෙන අනිටු විපාක දෙකක් ලියන්න.

2. සමජීවිකතාව යනු කුමක් ද යි ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

3. සමජීවිකතාවට පටහැනි වූ පරිභෝජන ක්‍රම දෙක හඳුන්වන්න.



## පැවරුම

පන්ති කාමරයේ දී පරිහරණය කරන දේ උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමට ඔබ කරන යෝජනා ලැයිස්තුවක් සකස් කොට විෂය භාර ගුරුතුමාට/තුමියට පෙන්වන්න.



## පුහුණුවට

ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය
ද්වීහි කම්මං පයෝජයේ
චතුත්ථංච නිධාපෙය්‍ය
ආපදාසු භවිස්සති.